W.M. සිරිල් බණ්ඩාර

/ දන්දෙනිය විද්‍යාලය

# තල් කොළ කලා කර්මාන්තය

- තල් ගස ඒක බීජ පත්‍ර ශාකයකි. ගසේ සියළු කොටස් වලින් විවිධ නිරිමාණ සිදුකරයි. ප්‍රධාන මාධ්‍ය පත්‍රයි.
- තල් ගස ව්‍යාප්තව ඇති උතුරු නැගෙනහිර පළාත්වල කර්මාන්තය දැකිය හැකිය. මඩකලපුව, යාපනය මෙම කර්මාන්තය සඳහා ප්‍රසිද්ධව ඇත.



## <u>තල් කොළ ඇසුරින් නිර්මිත භාණ්ඩ</u>

- පැදුරු පෙට්ටි, කඩහම් (විශාල පෙට්ටි)
- කුල්ල
- උවෙල් කොත්තු මුඩල් (පෙට්ටි විශේෂයකි)
- කුට්ටාන් (හකුරු බහාලන උපකරණ)
- විලාසිතා ආභරණ
- බිත්ති සැරසිලි









**<u>තල්කොළ නිර්මාණ සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ</u>**

| නිර්මාණ | මඩකලපුව | යාපනය |
|---|---|---|
| පැදුර | පාලමින්මඩු, තාලංකුඩා | වේලනෙයි, වරනි, අල්වායි |
| කුල්ල | පුදුක්කුඩියිරුප්පු | මානවලෙයි, මාහියප්පිට්ටි, සින්නමඩු |
| තොප්පි | තාලජකුඩා, තිරායිමඩු | මට්ටුවිල්, අල්ලාරෙයි |
| මළු කුඩ | කල්කුඩා, තාලංකුඩා | පෙට්ටි - එලුවෙයි තීවු, උඩුප්පිට්ටි, පුත්තූර් |

**<u>පැදුරු නිර්මාණ</u>**

❖ පැදුරු නිර්මාණයේ දී විවිධ ශල්පක්‍රම භාවිතා කරයි. බහුල වශයෙන් කාන්තාවන් නියැලී සිටී.

පැදුරු වර්ග

- කදීර්පායි (අස්වනු පැදුරු) - ගොයම් පෑගීම වී වේලීම වැනි කෘෂිකර්ම කටයුතු සඳහා යොදාගනී.
- පඩුක්කේයි පායි (නිදන පැදුරු) - නිදාගැනීමට ගත් පැදුරු.
- වර්ණ පැදුරු - මංගල අවස්ථාවන් සඳහා යොදාගනී.
- පන්දීප් පායි (උත්සව පැදුරු)
- සොට්ටුප්පායි (බත් පැදුරු)



තල් කොල පැදුරු

**යොදන සැරසිලි රටා**

සියඹලා ඇට රටාව, තරු රටාව, හතරැස් රටාව, මහාකෝණී ත්‍රිකෝණ රටාව, තිත් රටා ජ්‍යාමිතික හැඩතල යොදා ගිරවා, ගස, මල, පුසාන්දිරම්

**වර්ණ ගැන්වීම**

- සායම් තේ හැන්දක් ජලය ලීටරයක් මිශ්‍රකර උණුකර
- කපා ඉරාගත් තල් කොළ මිනිත්තු 05 ක් තම්බාගෙන ජලයෙන් සෝදා මද පවනේ වියළා ගනී.
- සාම්ප්‍රදායික ක්‍රමයට අනුව කුකුල් සායම් සමග ලුණු අරළු මිශ්‍රකර තම්බාගනු ලැබේ.
- වෙනත් වර්ණ ලබාගන්නේ කොළ පාට රතු පාට දම් පාට කහ කුඩු හෝ දියර සමග මිශ්‍රකර ගැනීමෙනි.

**ඇගයීම**

1. තල් කොළ කලා කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ නම් කරන්න.
2. පැදුරු විවීමේ ශිල්ප ක්‍රමය කුමක් ද?
3. තල් කොළ භාවිතයෙන් කරන නිර්මාණ නම් කරන්න.
4. වර්ණ සකස් කර ගන්නා ආකාරය හා භාවිතය විස්තර කරන්න.
5. පැදුරු වල දැකගත හැකි රටා නම් කරන්න.